# අම්මාවරුනේ කුමක් සඳහා ද?

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ තවත් සිනමා සිත්තමක චමත්කාරය විඳගැනීමේ අවස්ථාව ශ්‍රී ලාංකික අපට උදා වී ඇත.

කලක් ශ්‍රී ලාංකේය සමාජයේ අධිපතීත්වය දැරූ වලව් පැළැන්තියේ බිඳ වැටීම මීට අඩසියවසකට පමණ පෙර දී සනිටුහන් විය. එය අපි ''ගම්පෙරළිය'' තුළින් නැරඹුවෙමු. ඉන් අනතුරුව ජාතික පිබිදීම්, ආණ්ඩු මාරුවීම්, විමුක්ති අරගල, විවෘත ආර්ථිකය, ත්‍රස්තවාදය ආදී නොයෙක් දෑ මතින් දෝලනය වෙමින් ඇදී එන ජන සමාජයේ එක් පැතිකඩක් ''සෙයිලම'' තුල සිත්තම් විය. ගම් පෙරළියෙන් ඇරඹී දිනෙන් දින දිග හැරෙන සමාජ පෙරළියේ දී අප කෙතරම් විමුක්ති ගී ගැයුවද, අපව ආර්ථික ප්‍රශ්න මඟින් කෙතරම් හෙම්බත් කෙරුන ද, අප මතට කෙතරම් වෙඩි උණ්ඩ පතිත වුව ද කොටින්ම ''සෙයිලම'' දී අප කෙතරම් විපරීත වුව ද, තවමත් අප අතර එක් දෙයක් ඉතිරිව ඇත. එනම් ගෙදර බුදුන්ගේ ගුණ කඳයි. අම්මාවරුනේ නරඹමින් එහි මෑණියන් සමඟ කඳුලු වගුරුවන, සෝ සුසුම් හෙලන ප්‍රේක්ෂක සමූහය ඊට සාක්ෂි දරනු ඇත.

ආචාර්ය ලෙස්ටර් මෙම වික්‍රමය කරනුයේ කාන්තා නිරුවත ඉදිරියට දමා නොවේ. අඳුරෙහි හෝ එළියෙහි පෙන්වන ලිංගික දර්ශන තම සිත්තම තුලට රිංගවා නොවේ. මාතෘ ප්‍රේමය සමඟ ශෘංගාරය පටලවා නොවේ. ඔහු ඒ වික්‍රමය කරනුයේ මවු සෙනෙහස නම් අධ්‍යාත්මීය සම්බන්ධය ඉදිරියට දැමීමෙනි. මව් ගුණයත් මවකගේ කඳුලෙහි උණුසුමක් තම සිත්තම තුලට රිංගවීමෙනි. එසේනම් ඉන් අප පසක් කරගත යුතු සත්‍ය කුමක් ද? කවුරු කෙතරම් තැතනුව ද, අප සමාජය තවමත් විපරීත වී නොමැති බවයි. අපගේ ආධ්‍යාත්මය තවමත් කිළිටි වී නොමැති බවයි. මවු සෙනෙහස පිය සෙනෙහස හඳුනන තවමත් සවිමත් සිංහල බෞද්ධ විඥානයක් මඟින් අපව මෙහෙයැවෙන බවයි. මවකගේ අධ්‍යාත්මය ඉස්මතු කරන මෙම සිනමා සිත්තම අපට සමීප වන්නේ එබැවිනි. ලෙස්ටර් සාර්ථක වන්නේ ඔහු එම ජන විඥානයට ආමන්ත්‍රණය කරන බැවිනි.

නමුත් අපට එතැනින් නැවතී සතුටු විය හැකි ද? නොහැකි ය. මන්දයත්, ලෙස්ටර් අපව තවත් පසෙකට කැන්දන් යන බැවිනි. දශක දෙකක් පුරා අපව පෙළන ත්‍රස්තවාදය නම් කුරිරු ශාපය ඔහු ගෙනහැර පායි. සැබැවින්ම එම ත්‍රස්තවාදය යනු කුමක් ද? එය අනෙකක් නොව සිංහලත්වයට විරුද්ධ සටනකි. මාතෘත්වය පීතෘත්වය අගයමින් අපේකම රැකගනිමින් ජන මනස පෝෂණය කරන සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහි සටනකි. රටෙහි ඒකීයත්වය නැතිකර එම සංස්කෘතියේ අක්මුල් වනසා දැමීම ඉලක්ක කරගත් සටනකි. කොටින්ම ලෙස්ටර්ව සාර්ථක කරවන සමාජ විඥානය විනාශ කර දැමීමට ගෙන යන සටනකි.

එසේනම් අප ක්‍රියා කළ යුත්තේ කුමක් සඳහා ද? එම ත්‍රස්තවාදය ද එයට හා එහි අවසන් අරමුණට ඍජුව හෝ වක්‍රව අනුබල දෙන පවිටු බලවේග පරාජය කිරීම සඳහා ය. එහි දී කලාකරුවකුගේ, වෙසෙසින්ම ලෙස්ටර් වැනි දේශීයත්වයේ සවිබල හඳුනාගත් (ඉන් සාර්ථකත්වයට පත්) සිනමාකරුවකුගේ අරමුණ විය යුත්තේ ඊට අවැසි තිසි මගේ සමාජය මෙහෙයැවීමයි. ඔවුන්ගේ සිනමාකෘති තුළ මවුන්ගේ කඳුල ගලා යා යුත්තේ පවිටු ත්‍රස්තවාදයට එරෙහි වීරත්වය සෝදා හැරීම පිණිස නොව ඊට අවැසි ජීව බලය ලබා දීම පිණිසය. එය කාලීන දේශීය අවශ්‍යතාවයකි, යුතුකමකි, ලෙස්ටර් වැන්නකුගේ වගකීමකි. නමුත් එතුමාගේ අම්මාවරුනේ සිනමා සිත්තම තුල ගැබ් වී තිබුණේ එම අරමුණ ද නැතිනම් ඊට ප්‍රතිවිරුද්ධ අරමුණක් ද යන්න සැක සහිතය.

ලෙස්ටර් එතැනින් ද නොනවතී. සිංහල බෞද්ධ ජන විඥානය පිළිබඳව අවබෝධය කෙතරම් තියුණුදැයි කිවහොත් තම කෘතිය තුල දී එහි අතිශය සංවේදී ස්ථාන කිහිපයක් එකවර ස්පර්ශ කිරීමට ඔහු සමත් වෙයි. ඉහත දී සඳහන් කෙරුණු මාතෘත්වය ඉන් එකකි. භික්ෂුත්වය තවත් එවන් සංවේදී ස්ථානයකි. ඉතිහාසය පුරාවටම අප සමාජය පෝෂණය කළ රැකගත් සහ මෙහෙයැවූ බලවේගය එයයි. කසාවතින් බැබළුනු සෑම විටකම රටෙහි පුනර්ජීවනයක් ඇති වූ අතර කසාවත තර්ජනයට ලක් වූ සෑම විටකම අපට පරිහාණිය උරුම විය. කොටින්ම කසාවතින් තොර සිංහල බෞද්ධ සමාජයක පැවැත්මක් සිදුවිය නොහැකි ය. තවත් ලෙසකට කිවහොත් ලෙස්ටර් ව සාර්ථකත්වයට පත්කළ ජන විඥානයක පැවැත්මක් සිදුවිය නොහැකි ය.

නමුත් අම්මාවරුනේ තුළ සිදුවී ඇත්තේ කුමක් ද? මහණකම මරණයට හිමිකමක් බව සිනමාකරු පවසයි. සමහර විට එය යුද්ධයට යාමට ද වඩා බියකරු විය හැකි ය. පුතුන් යුද්ධයට ගිය ද සසුනට ගිය ද අම්මාවරුන්ට සිදුවන්නේ නොමැරී මැරෙන්නට බව ඔහු පවසයි.

සැබැවි, එය එසේ ද විය හැකි ය. නමුත් ඒ අන් කිසිවක් නිසා නොව, මා විසින් ඉහත දී සඳහන් කරන ලද ත්‍රස්තවාදය ප්‍රමුඛ දුෂ්ඨ බලවේග වල ක්‍රියාකාරිත්වය නිසා ය. නමුත් ලෙස්ටර් එම බලවේග වලට එනම් නිසි තැනට, නිසි ලෙසට ආමන්ත්‍රණය නොකරයි.

චිත්‍රපටය තුළින් අප අත්දකින්නේ කුමක් ද? ලෙස්ටර් ප්‍රේක්ෂකයාගේ කනට කොඳුරා කියන්නේ යුද්ධයට යෑමෙන් තාරුණ්‍යය විනාශ වන බවයි. අපව නන්නත්තාර වන බවයි. සසුන්ගත වීමෙන් අපව දෙලොවක් අතර අතරමං වන බවයි. ජීවිතය නිරපරාදේ වැනසෙන බවයි. මෙම දෙකම මරණයට හිමිකම් වන බවයි. යුද්ධයට ගිය ද සසුනට ගිය ද ඒ දෙකෙන්ම අම්මාවරුන් ගිනිගෙන දැවෙන බවයි. අබළං ගෙපැල් තුළ ඕතොමෝ නොමැරී මැරෙන බවයි.

මේ කාලකන්ණි තත්ත්වයෙන් ගොඩ ඒමට ත්‍රස්තවාදය වැනසිය යුතු බව ඔහු නොපවසයි. ඔහු ඒ තතු ප්‍රේක්ෂකයාගෙන් වසන් කරයි. ඒ වෙනුවට නොකියා කියන්නේ යුද්ධයට හෝ සසුනට ගොස් කාලකන්ණියකු නොවී ය යුතු බවයි. මා පවසන්නේ ඔහු දෙන පණිවිඩය එසේ නොවිය යුතු බවයි.

නමුත් කිසිවෙක් මෙසේ ප්‍රශ්න කළ හැකි ය. එනම් සිනමාකරුවන් කළ යුත්තේ රට රැකීම ද යන්නයි. ඔවුන් පෙනී සිටිය යුත්තේ කුමන අරමුණ වෙනුවෙන් ද යන්න අපට නිගමනය කළ හැකි ද යන්නයි. මා පවසන්නේ සිනමාකරුවකු අඩුම තරමින් ඔහු වෙනුවෙන් පෙනී සිටිය යුතු බවයි. එනම් ලෙස්ටර් මහතා ඔහු වෙනුවෙන් පෙනී සිටිය යුතු බවයි. ඔහු සාර්ථක වී ඇත්තේ සිංහල ජන මනස ස්පර්ශ කරන බැවිනි. එසේ ස්පර්ශ කිරීමට ජන මනසක් ඉදිරියටත් පැවතිය යුතු ය. එසේනම් ඔහු එම සිංහල බෞද්ධ ජන විඥානය වෙනුවෙන් (ඔහුගේ සාර්ථකත්වය වෙනුවෙන්) පෙනී සිටිය යුතු ය. නැතිනම් ඔහුට පැවැත්මක් නැත.

මා දකින ආකාරයට ආචාර්ය ලෙස්ටර් මහතා අත්තක් උඩට නැග අපරීක්ෂාකාරීව පිනුම් ගසයි. එවිට එම අත්තේ මුල සිඳී යා හැකි ය. එය තවදුරටත් ඔහුගේ යහපතටනම් හේතු නොවනු ඇත.

ඉඳුනිල් ප්‍රසන්න
ඉංජිනේරු පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය.